# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.18 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1861 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

## 01. වෙළෙඳසැල් බිඳ දේපල සොරකම් කල සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීම - මහරගම පොලිස් ස්ථානය.

2024.12.17 වන දින උදෑසන කාලයේ මහරගම පොලිස් වසමේ බෝධිවත්ත ප්‍රදේශයේදී මහරගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් අපරාධ නිවාරණ මෙහෙයුම් රාජකාරි යෙදී සිටියදී, ලද තොරතුරක් මත විමර්ශනයකට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 41 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදුකරන ලද ප්‍රශ්ණ කිරීමේදී, මොහු මහරගම හා මිරිහාන පොලිස් වසම්වල වෙළෙඳසැල් බිඳ දේපල සොරකම් කිරීමේ සිද්ධීන් කිහිපයකට සම්බන්ධ සැකකරුවෙකු බවට අනාවරණය වී ඇත.

වැඩිදුර ප්‍රශ්ණ කිරීමේදී සැකකරු විසින් සොරා ගන්නා ලද දේපල වලින් කොටසක් පොලිසිය විසින් සොයා ගෙන ඇති අතර මහරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. හෙරොයින් සමඟ සැකකාරියක් අත්අඩංගුවට - නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.12.17 වන දින දහවල් කාලයේ මහරගම පොලිස් වසමේ දුම්රියපොල මාර්ගයේදී නුගේගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 900 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක් අත්අඩංගුවට ගෙන මහරගම පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 71 ක් වන මහරගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මහරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ පොලිස් ස්ථානය.**

2024.12.17 වන දින සවස් කාලයේ ගම්පහ පොලිස් වසමේ උඩුගම්පල හංදියේදී ගම්පහ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 300** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කොලොන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගම්පහ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සහ හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.**

2024.12.17 වන දින උදෑසන හා දහවල් කාලයේ පැලියගොඩ පොලිස් වසමේ දුටුගැමුණු මාවතේදී හා දිප්පිටිගොඩ ප්‍රදේශයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් දෙකක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 800 ක් හා හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 31 හා 32 වයස්වල පසුවන පැලියගොඩ හා කැළණිය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - වාරියපොල පොලිස් ස්ථානය.**

2024.12.17 වන දින දහවල් කාලයේ වාරියපොල පොලිස් වසමේ මහකෙලිය ප්‍රදේශයේදී වාරියපොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් ලීටර් 78 මිලි ලීටර් 750 (බෝතල් 105)** ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 44 ක් වන කෙලිමුණේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාරියපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කුරුවිට පොලිස් ස්ථානය.**

2024.12.17 වන දින දහවල් කාලයේ කුරුවිට පොලිස් වසමේ වැලිහිඳ ප්‍රදේශයේදී කුරුවිට පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 42 ක් වූ කුරුවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කුරුවිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - මොරගොල්ලාගම පොලිස් ස්ථානය.

2024.12.17 වන දින උදෑසන කාලයේ මොරගොල්ලාගම පොලිස් වසමේ ගල්ගිරියා කන්ද ප්‍රදේශයේදී මොරගොල්ලාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 21 හා 30 යන වයස්වල පසුවන මඩගල්ල සහ මොරගොල්ලාගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

මොරගොල්ලාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - තොඩුවාව පොලිස් වසම.

2024.12.17 වන දින සවස් කාලයේ තොඩුවාව පොලිස් වසමේ හලාවත කොළඹ ප්‍රධාන මාර්ගයේ මහවැව ප්‍රදේශයේදී හලාවත දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ වෑන් රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දිසාවෙන් පැමිණි යතුරු පැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදියේ පැදිකරු හා ඔහුගේ දියණිය බරපතල තුවාල ලබා මාරවිල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 50 ක් වූ බෝවත්ත, බිංගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාරවිල රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර වෑන් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තොඩුවාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - කළුතර උතුර පොලිස් වසම.

2024.12.17 වන දින උදෑසන කාලයේ කළුතර උතුර පොලිස් වසමේ කළුතර හොරණ මාර්ගයේ ගල්පාත ප්‍රදේශයේදී කළුතර දෙස සිට හොරණ දෙසට ගමන් කළ පාපැදියක් පැදිකරුට පාලන කරගැනීමට නොහැකිව ඊට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි යතුරුපැදියක ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් පාපැදිකරු බරපතල තුවාල ලබා ගල්පාත රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා හොරණ රෝහලට මාරු කර යැවීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 83 ක් වූ ගල්පාත, කළුතර උතුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. කළුතර උතුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - වැල්ලවාය පොලිස් වසම.

2024.12.17 වන දින උදෑසන කාලයේ වැල්ලවාය පොලිස් වසමේ වැල්ලවාය තණමල්විල මාර්ගයේ හඳපානාගල ප්‍රදේශයේදී වැල්ලවාය දෙස සිට තණමල්විල දෙසට ධාවනය වූ යුධ හමුදා ජීප් රථයක් එම දිශාවටම ඉදිරියෙන් ගමන් කළ යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු බරපතල තුවාල ලබා හඳපානාගල රෝහලට ඇතුලත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා වැල්ලවාය රෝහලටත්, එම රෝහලෙන් මොණරාගල රෝහලටත් ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 64 ක් වූ තෙළුල්ල, ඇතිලිවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මොණරාගල රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් ජීප් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැල්ලවාය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - ඇහැළියගොඩ පොලිස් වසම.

2024.12.17 වන දින සවස් කාලයේ ඇහැළියගොඩ පොලිස් වසමේ කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයේ මැරේකැලේ වත්ත ප්‍රදේශයේදී රත්නපුර දෙස සිට ඇහැළියගොඩ දෙසට ධාවනය වූ යතුරුපැදියක් පදික මාරුවෙන් මාර්ගය හරහා ගමන් කළ පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා හා පසු පැදිකරු ඇහැළියගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී පදික පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ ඉහළ පොහොරබාව, පරකඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ඇහැළියගොඩ රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් යතුරුපැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. ඇහැළියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**